

## ලියා දන්වන වග යි

### සුබ නව වසරක්

නව වසරක ඇරඹුම ජීවිතයේ නව බලාපොරොත්තු ඇති කරගන්නට සුදුසු ම කාලයයි. හෙට දවස ගැන සුබාවදීව සිතන්නට ඇති හැකියාව ජීවිතයට ශක්තියකි. සන්නස පාඨක ඔබ සැමට ඒ වෙනුවෙන් සුබ පතන්නට අපි කැමැත්තෙමු.

එළැඹුණ වසර සන්නස ට ද වැදගත් වසරක් වනු ඇත. අපේ ගමන පිළිබඳ වැගත් තීන්දු ගන්නට මේ වසර අපට ඉඩ ලබා දෙනු ඇති බව නිසැක ය.

සන්නස ඔබ අතට පත් වන්නේ කුඩා මිනිසුන් දෙතුන් දෙනෙකුගේ අති මහත් කැපවීම නිසා ය. ශතයකවත් ආර්ථික වාසියක් නොලබා පුවත්පතක් පවත්වාගෙන යාමට ශක්තිය අපට ලබා දෙන්නේ මේ සුන්දර මිනිසුන් ගැහැණුන් දෙතුන් දෙනා ගේ කැපවීම ය.

සිය කාලය ශ්‍රමය කැප කරමින් සන්නස ට ලියන අපේ ලේඛක ලේඛිකාවන්ටත් අපට අනුග්‍රහය දක්වන ව්‍යපාරික ආයතන වලටත් සන්නස පාඨක ඔබ සැමටත් සුබ නව වසරක් වේවායි පතන්නෙමු.

### බලාපොරොත්තු

නව වසර ශ්‍රී ලංකාවට උදාවන්නේ අසුබ පුවත් රැසක් සමගින් ය. දිගින් දිගටම ඇදෙන යුද්ධය විසින් විනාශ කර දමනු ලැබීමේ අභාග්‍යයට මුහුණ දෙමින් සිටින ලංකාව දිනෙන් දිනම පිරිහෙන්නේ යුද්ධය නිසා ම නොවේ. දූෂණය හමුවේ මුනිවත රකින අයුක්තිය හමුවේ අකර්මණ්‍ය වන පාදඩකරණය හමුවේ අන්ධව සිටින පාලකයන් අපට ලැබෙන්නේ කුමන අවාසනාවකට ද.?

යුද්ධය නමැති කඩතුරාවෙන් සියල්ල සැමදා වසා දැමිය නොහැකි ය.

දූෂිතයන් ආරක්ෂා නොකරන පාදඩයන් දඟගෙට දමන යහ පාලනයක් අපේ රටට අවශ්‍යව ඇත.

### ආදර්ශය

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ මහ ඇමතිවරයාගේ පුත්‍රයා පැදවූ රිය ගසක හැපුණි. මහ ඇමති පුතා ඒ මොහොතේ බීමත්ව සිටි බව අනාවරණය විය. දේශපාලන ලෝකයේ දිග ගමනක් යන්නට ශක්‍යතාව තිබූ තරුණ මහඇමතිවරයා සිය තනතුරෙන් පමණක් නොව දේශපාලනයෙන් ද ඉවත් විය.

ඇමති වරුන් සම්බන්ධව ශ්‍රී ලංකාවේ සිදුවන සිදුවීම් හා මේ සිදුවීම සන්සන්දනය කර බැලීම ඔබට බාර ය.

## සන්නස

සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි



## සමනොළ සිරිපා

කඳු කොමළියන් ඇඳි මිහිදුම් සලුව සලා
ඉර සේවයෙන් පරිසරයම එකළු කළා
රන් සමනලුන් රොද බැඳ පිය යුගල සලා
හෙමිහිට ඇදෙති සමනළ කඳු මුදුන බලා

පරසතු මලින් පුද දී සිරිපද වැන්ද
පැදකුණු කරති දෙව්වරු සමනළ කන්ද
සමනළ පිරිස ඒ අසිරිය රස වින්ද
තුඩ තුඩ තබති හිමි බුදු ගුණ මකරන්ද

තිලොවට තිලක හිමි පදලස නිදන් කළ
අබිමානයකි පුදබිම බොදු දනන් තුළ
පින් කෙත මහඟුතම සිරිලක පහන් කළ
කරුණා කරන හඬ පැතිරෙයි සමන් කුළ

දුටුවා විලස අප අබියස අපගෙ බුදුන්
මැවුණා විලස දම් දෙසනා අපගෙ බුදුන්
විහිදූ විලස සුදු බුදු රැ ස් අපගෙ බුදුන්
අපි යමු වඳින්නට සිරිපද අපගෙ බුදුන්

ජගත් වෙත්තසිංහ

සන්නස
SANNASA

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සමබන්ධීකරණය**

**NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055
**WA** Kapila Hemantha Balage 08 9456 1972
**QLD** Ananada Samaratunga 07 3372 7953
**ACT** Asoka Nimalasiri 0400 429 031
**SA** Chandta Eeriyagama
**TAS** Anura Seneviratne 03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.